# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

# Mahinda Rajapaksha College - Homagama

## දෙවන වාර පරීක්ෂණය - 2011

## First Term Test - 2011

## විද්‍යාව Science

**6 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

**Grade 6** **Time – 02 hours**

Name/Index No:-..........................................................................................................................................

## 1 කොටස

## part 1

- Answer all questions සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- Underline the correct answer. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. Identify the objects in far environment. (දුරස්ත පරිසයේ ඇති වස්තුවක් හඳුනාගන්න.)
   i) House නිවස ii) School පාසල iii) Tree ශාකය iv) sun සූර්යයා

2. How do we identify things in the environment at first? ( අප පරිසරයේ ඇති ද්‍රව්‍ය ප්‍රථමයෙන්ම හඳුනාගන්නේ කෙසේද?)
   i) By observations නිරීක්ෂණ මගින් ii) By experiments පරීක්ෂණ මගින්
   iii) By conclusions නිගමන මගින් iv) By concepts සංකල්ප මගින්

3. Select the correct measurement and the instrument නිවැරදි මිනුම සහ උපකරණය තෝරන්න.

| Measurement (මිනුම) | Instrument (උපකරණය) |
|---|---|
| i. To read tiny letter<br>ඉතා කුඩා අකුරු කියවීමට | Hand lence<br>අත්කාචය |
| ii. To measure the temperature<br>උෂ්ණත්වය මැනීමට | Barometer<br>පීඩනමානය |
| iii. To measure the length<br>දිග මැනීමට | Telescope<br>දුරේක්ෂය |
| iv. To measure the mass<br>ස්කන්ධය මැනීමට | Microscope<br>අන්වීක්ෂය |

4. What is the Kelvin value for $27^0$ C ? $27^0$ C යනු කෙල්වින් අගයෙන් කීයද?
   i) 273K ii) 300 K iii) 127 K iv) 400 K

5. Select the correct SI unit නිවැරදි සම්මත ඒකකය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| i) Time - Second<br>කාලය - තත්පර | ii) Length - kilometer<br>දිග - කිලෝමීටර | iii) Mass -Gram<br>ස්කන්ධය - ග්‍රෑම් | iv) Temperature - Celcius<br>උෂ්ණත්වය - සෙල්සියස් |

6. Select the common feature of the living organisms. ජීවීන්ට පොදු ලක්ෂණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| i) Photosynthesis<br>ප්‍රභාසංස්ලේෂණය | ii) Locomotion<br>සංචරණය | iii) Autotrophic<br>ස්වයංපෝෂී වීම | iv) Growth<br>වර්ධනය |

7. Select the correct sentence නිවැරදි වාක්‍යය තෝරන්න.

i) Some Aquatic animals use lungs for respiration
ඇතැම් ජලජ ජීවීන් ශ්වසනය සඳහා පෙනහළු භාවිතා කරයි

ii) Arboreal animals have scales for their locomotion
රුක්වැසි සතුන්ට සංචරණය සඳහා කොරළ පිහිටා ඇත.

iii) Soil animal do not contribute to produce fertile soil
පාංශු ජීවීන් පස සරු කිරීම සඳහා සහභාගී නොවේ.

iv) Terrestrial animals do not have well developed sensory organs
භෞමික ජීවීන්ට දියුණු සංවේදී ඉන්ද්‍රිය පිහිටා නැත.

8. How can you classify animals according to their symmetry ? සමමිතියට අනුව සතුන් වර්ග කළ හැක්කේ කෙසේද?

| | |
|---|---|
| i) Autotrophic and heterotrophic | ස්වයංපෝෂී හා විෂමපෝෂී |
| ii) Bilateral, radial and no symmetry | ද්විපාර්ශවික " අරීය හා අසමමිතික. |
| iii) Vertebrates and invertebrates | පෘෂ්ඨවංශීන් හා අපෘෂ්ඨවංශීන් |
| iv) Flying, walking and creeping | පියඹායන ඇවිදින හා බඩගායන. |

9. What is the process of water releasing from plant leaves as vapour? ශාක පත්‍රවලින් ජලය වාෂ්ප ලෙස ඉවත් වීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ කෙසේද?

| | | | |
|---|---|---|---|
| i) Condensation<br>ඝනීභවනය | ii) Transpiration<br>උත්ස්වේදනය | iii) Evaporation<br>වාෂ්පීකරණය | iv) Absorption<br>අවශෝෂණය |

10. Select the most important gas for existence of animals ජීවීන්ගේ පැවැත්මට වඩාත්ම වැදගත් වායුව තෝරන්න.

| | | | |
|---|---|---|---|
| i) Methane<br>මීතේන් | ii) Carbon dioxide<br>කාබන් ඩයොක් සයිඩ් | iii) Oxygen<br>ඔක්සිජන් | iv) Nitrogen<br>නයිට්‍රජන් |

11.. Select the sedentary organism. ඔත් ජීවිතයක් ගත කරන ජීවියා තෝරන්න.

| | | | |
|---|---|---|---|
| i) Sea anemone<br>මුහුදු මල | ii) Corral hydra<br>කොරල් බුහුබාවා | iii) Some oysters<br>ඇතැම් බෙල්ලන් | iv) All of above<br>ඉහත සියල්ලම |

12. Select the immersed aquatic plant නිමග්න ජලජ ශාකය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| i) Ichonia<br>ජපන්ජබර | ii) Lotus<br>නෙළුම් | iii) Valisneria<br>වැලිස්නේරියා | iv) Salveinia<br>සැල්විනියා |

13. What is the stem which grows hanging on to a support? ආධාරකයක සවි වී ඉහල නගින කඳන් වර්ගය කුමක්ද?

| | | | |
|---|---|---|---|
| i) Climbing stems<br>ආරෝහක කඳන් | ii) Creeping stems<br>ධාවක කඳන් | iii) Underground stems<br>භූගත කඳන් | iv) Branched stems<br>අතු බෙදුනු කඳන් |

14. Select the epiphyte අපිශාකය තෝරන්න.

i) Pistia දියගෝවා
ii) Cactus පතොක්
iii) Pandanus වැටකෙයා
iv) Dryaria බේදුරු

15. Leaves of some xerophytes plants turned into thornes. Why is that? ඇතැම් ශුෂ්ක ශාක වල පත්‍ර කටු බවට හැරී ඇත්තේ ඇයි?

i) To reduce photosynthesis ප්‍රභාසංස්ලේෂණය අඩු කිරීම සඳහා
ii) To reduce the emission of water ජලය පිටවී යාම අඩු කිරීම සඳහා
iii) To increase the water absorbtion ජලය උරා ගැනීම වැඩි කිරීම සඳහා
iv) To increase the air absorbtion වාතය උරා ගැනීම වැඩි කිරීම සඳහා

16. Where is the ozone layer found ?ඕසෝන් ස්තරය පිහිටා ඇත්තේ කොහේද?

i) In troposphere පරිවර්තීගෝලයේ
ii) In stratosphere ස්තර ගෝලයේ
iii) In mesosphere ශීත ගෝලයේ
iv) In thermosphere තාප ගෝලයේ

17. How were igneous rocks made? ආග්නේය පාෂාණ සෑදී ඇත්තේ කෙසේද?

i) By cooling lava ලාවා සිසිල් වීම නිසා
ii) By precipitating salts in the sea මුහුදේ ලවණ තැන්පත් වීම නිසා
iii) By exposing to temperature and pressure for long time දිගු කාලයක් උෂ්ණත්වයට හා පීඩනයට හසු වීම නිසා
iv) None of the above ඉහත කිසිවක් නොවේ

18. Select the method for conservation of domestic water. නිවසේ ජලය සංරක්ෂණ සඳහා සුදුසු ක්‍රමයක් තෝරන්න.

i) Keepng the taps open when not in use ජලය ලබා නොගන්නා විට ජල කරාම විවෘත ව තැබීම.
ii) Using more water when bathing and washing නෑම හා සේදීම් කටයුතු වලදී අවශ්‍ය ප්‍රමාණයට වඩා ජලය භාවිතය
iii) Collecting and using rain water වැසි ජලය එක් කර භාවිත කිරීම
iv) Not repairing the leaking water pipes. කාන්දු වූ ජල නල වලට පිළියම් නොයෙදීම

19. What is the direction of earth rotation ?පෘථිවිය භ්‍රමණය වන්නෙ කවර දිශාවකටද?

i) Form west to east බටහිර සිට නැගෙනහිර දිශාවට
ii) From east to westනැගෙනහිර සිට බටහිර දිශාවට
iii) From north to south උතුරේ සිට දකුණට
iv) From South to north දකුණේ සිට උතුරට

20. What is the country which faced a leakage In nucleous power stations due to earth quacks recently? මෑතකදී භූමිකම්පා හේතුවෙන් න්‍යෂ්ටික බලාගාර කාන්දු වීමකට මුහුණ දුන් රට කුමක්ද?

i) India ඉන්දියාව
ii) China චීනය
iii) Japan ජපානය
iv) America ඇමරිකාව

(2 x 20 = 40)

# PART II
## 11 කොටස

- ❖ **Answer 5 questions including the first question** පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ පහකට පිළිතුරු සපයන්න.

- ❖ **16 marks for first question and 11 marks for each of the other questions.** පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 11 බැගින්ද හිමිවේ.

**1. Answer the following questions bases on what you created using the parts of plants and animals for the first assessment in the second term.** දෙවන වාරයේ පළමු ඇගයීම් ක්‍රියාවලිය ලෙස ඔබ විසින් ශාක හෝ සත්ව කොටස් උපයෝගී කරගෙන කරන ලද නිර්මාණ ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i) What did you create? ඔබ විසින් කරන ලද නිර්මාණය කුමක්ද? (ල 01)

ii) Name the parts for plants or animals you used ඔබ විසින් භාවිතා කරන ලද ශාක හෝ සත්ත්ව කොටස් නම් කරන්න. (ල 02)

iii) Briefly describe how you created that ඔබ නිර්මාණය සිදු කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල 05)

iv) Write 3 benefits of plants and animals for man ශාක හා සතුන් නිසා මිනිසාට ඇති ප්‍රයෝජන 3 ක් සඳහන් කරන්න. (ල 03)

v) Why should be protect plants and animals ? ශාක හා සතුන් ආරක්ෂා කල යුත්තේ ඇයි ? (ල 02)

vi) Draw 3 leaf shapes you have seen ඔබ දැක ඇති ශාක පත්‍ර හැඩ 3 ක් අඳින්න (ල 03)

2.

i) Draw a plant with a tap root system. Name the parts of it මුදුන් මුල් පද්ධතියක් සහිත ශාකයක රූප සටහනක් අඳින්න. එහි කොටස් නම් කරන්න. (ල 02)

ii) Name the parts of the leaf ශාක පත්‍රයේ කොටස් නම් කරන්න. (ල 02)




iii) Give two examples for each category of leaves. පහත සඳහන් ශාක පත්‍ර කාණ්ඩ සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න. (ල 02)

   a) Compound leaves සංයුක්ත පත්‍ර
   b) Leaves with parallel venation සමාන්තර නාරටි වින්‍යාසයක් සහිත පත්‍ර

iv) Use a dichotomous key to classify the following plants. දෙබෙදුම් සුචියක් භාවිතා කර පහත සඳහන් ශාක වර්ගීකරණය කරන්න. (ල 05)

Coconut, cactus , phyla, orchid, valisneria, mango පොල්" පතොක්" හිරමණදැත්ත" ඕකිඩ්" වැලිස්නේරියා" අඹ

3. Put the mark (√ ) if the sentence is correct. If not put the mark (x).

පහත සඳහන් වාක්‍ය නිවැරදිනම් ( √ ) ලකුණද වැරදිනම් ( x ) ලකුණද යොදන්න. (ල 02)

(i) (a) All living organisms produce energy through respiration. (-----)

සියලුම ජීවීන් ශ්වසනය මගින් ශක්තිය නිපදවාගනී.

(b) Excretion of waste matters is a common feature of plants.(-----)

අපද්‍රව්‍ය බැහැර කිරීම ශාකවලට පොදු ලක්ෂණයකි.

(c) Sensitivity is seen only in animals. (-----)

සංවේදීතාව (උත්තේජවලට ප්‍රතිචාර දැක්වීම) දක්නට ඇත්තේ සතුන් තුල පමණි.

(d) Plants do not produce their own foods. So they are called autotrophic organisms. (-----)

ශාක තම ආහාර නිපදවාගැනීම නොකරන නිසා ස්වයංපෝෂීන් ලෙස හඳුන්වයි

(ii) Complete the table. (ල 03)

වගුව සම්පූර්ණ කරන්න.

| Animal<br>සත්ත්වයා | Locomotion method<br>සංචරණ ක්‍රමය | Appendage used for locomotion<br>සංචරණය සඳහා යොදාගන්නා උපාංගය |
|---|---|---|
| (a)------------ | (b)---------------- | Wings<br>පියාපත් |
| Turtle<br>ඉබ්බා | (c)---------------- | (d)------------------ |
| Beetle<br>කුරුමිණියා | (e)----------------- | (f)------------------- |

(iii) Write four external features you can used to categorize animals.

සතුන් වර්ගීකරණය සඳහා යොදාගත හැකි බාහිර ලක්ෂණ හතරක් ලියන්න. (ල 02)

(iv) Mention the animal category to which the features mentioned in the table belong. (ල 04)

පහත වගුවේ දැක්වෙන ලක්ෂණ අයත් වන්නේ වාසස්ථානය අනුව කුමන සත්ත්ව කාණ්ඩයට දැයි සඳහන් කරන්න.

Animal Categories – Aquatic animals (ජලජ ජීවීන්)

සත්ත්වකාණ්ඩ Arboreal animals (රුක්වැසි ජීවීන්)

Terrestrial animals (භෞමික ජීවීන්)

Soil animals (පාංශු ජීවීන්)

| Feature (ලක්ෂණය) | Animal Category (සත්ත්වකාණ්ඩය) |
|---|---|
| Respiration through lungs or gills.<br>පෙනහළු හෝ කරමල් භාවිතයෙන් ශ්වසනය කරයි. | (a) ------------------- |
| Have fur to retain the body temperature.<br>ශරීර උෂ්ණත්වය ආරක්ෂා කරගැනීම සඳහා ලෝම පිහිටා ඇත. | (b)-------------------- |
| Have long fingernails, hands and legs.<br>දිගු නියපොතු සහ අතපය පිහිටා ඇත. | (c)-------------------- |
| Use oxygen dissolved in water to breathe.<br>ශ්වසනය සඳහා ජලයේ ද්‍රාව්‍ය ඔක්සිජන් භාවිතා කරයි. | (d)------------------- |
| Have well developed sensory organs to protect themselves from enemies.<br>සතුරන්ගෙන් ආරක්ෂාවීම සඳහා දියුණු සංවේදී උපාංග පිහිටා ඇත. | (e)------------------- |
| Take decayed plant parts as foods.<br>දිරාපත් වූ ශාක කොටස් ආහාරයට ගනී. | (f)-------------------- |
| Have scales for locomotion.<br>සංචරණය සඳහා කොරපොතු පිහිටා ඇත. | (g)-------------------- |
| Have fins or specialized legs for locomotion.<br>සංචරණය සඳහා වරල් හෝ විශේෂිත පාද පිහිටා ඇත. | (h)-------------------- |

4. i) Classify the following materials using a proper method පහත සඳහන් ද්‍රව්‍ය සුදුසු ක්‍රමයකට වර්ගීකරණය කරන්න. (ල 04)

a) Oxygen ඔක්සිජන් e) Ficus tree නුග ශාකය

b) Earth warm ගැඩවිලා
c) Ginger plant ඉඟුරු පැලය
d) Granite කළු ගල්
f) Clouds වලාකුළු
g) Water ජලය
h) Prawn ඉස්සා

ii) Classify following phenomena using a proper method. පහත සංසිද්ධි සුදුසු ක්‍රමයකට වර්ගීකරණය කරන්න.
(ල 04)

a) seed germination
බීජ ප්‍රරෝහණය

b) Weathering of rock
පාෂාණ ජීර්ණය

c) Barking of a dog
බල්ලකු බිරීම

d) Blowing of wind
සුළං හැමීම

e) Blasting of a volcano
ගිනිකන්දක් පිපිරීම

f) Evaporation of water
ජලය වාෂ්ප වීම

g) Rotation of earth
පෘථිවිය භ්‍රමණය වීම

h) Photosynthesis
ප්‍රභාසංසලේෂණ

iii) Complete the table. වගුව සම්පූර්ණ කරන්න. (ල 03)

| Measurement<br>මිනුම | Arbitary Unit<br>අභිමත ඒකක | Standard Unit<br>සම්මත ඒකක | Instrument<br>උපකරණය |
|---|---|---|---|
| Length<br>දිග | Span<br>වියත | ........................................ | .................................. |
| Mass<br>ස්කන්ධය | Kalan<br>කලං | ........................................ | .................................. |
| ........................................ | .................................. | Hour<br>පැය | Stop Watch<br>විරාම ඝටිකාව |

5. i) Fill in the blanks. හිස් තැන් පුරවන්න. (ල 04)

a) Earth takes ......................................hours to rotate one round around it's own axis.
පෘථිවිය තම අක්ෂය වටා එක් වටයක් භ්‍රමණය විමට පැය.......................................ගත කරයි.

b) Earth takes ...................................days to revolve around the sun.පෘථිවියට සූර්යයා වටා පරිභ්‍රමණය විමට දින .........................................ගත වේ.

c) Moon takes .................................days to revolve around the earth චන්ද්‍රයාට පෘථිවිය වටා පරිභ්‍රමණය වීමට දින ...................................ගත වේ.

d) Solar eclipse occurs on a ..........................................day. සූර්යග්‍රහණක් සිදුවන්නේ ...............................දිනකදී ය.

e) Different shapes of moon are called .................................................. චන්ද්‍රයාගේ විවිධ දෘශ්‍ය හැඩ ..........................................ලෙස හදුන්වයි.

ii) The followings are different shapes of the moon. Name them. (ල 04)
පහත දැක්වෙන්නේ චන්ද්‍රයාගෙ ප්‍රධාන දෘශ්‍ය හැඩ කීපයකි. ඒවා ඇති වන දිනයන් නම් කරන්න.




iii) We see that the sun rises in the east and sets in the west. Why is that ? අපට සූර්යයා නැගෙනහිරින් පායා බටහිරින් බැස යන්නා සේ පෙනෙන්නේ කවරකුගේ දෘශ්‍ය චලිතය හේතුවෙන් ද ? (ල 01)

iv) "Sun is a source of energy" Name 2 energy types of the sun. " සූර්ය යා ශක්ති ප්‍රභවයකි " සූර්ය යා නිදහස් කරන ශක්ති ආකාර 2 ක් සඳහන් කරන්න. (ල 02)

6.

i) Following diagram shows the water cycle. Name A&D . පහත දැක්වෙන්නේ ජල චක්‍රයේ රූප සටහනකි. A සිට D දක්වා ඇති ජලය සංසරණය වන අවස්ථා නම් කරන්න. (ල 04)




ii) Name 3 physical states of water. Give one esample for each. ජලය පවතින භෞතික අවස්ථා 3 නම් කර උදාහරණය බැගින් දෙන්න. (ල 03)

ii) Write 4 fields where water is utilized. ජලය භාවිතා වන ක්ෂේත්‍ර 4 ක් සඳහන් කරන්න. (ල 02)

iii) Write 4 methods which can pollute water. ජලය දූෂණය විය හැකි ආකාර 4 ක් සඳහන් කරන්න.

(ල 02)

7. i) Study the following diagrams carefully. පහත රූප සටහන් හොඳින් නිරීක්ෂණය කරන්න. (ල 04)










A B C D

Write the living environment of the above animals in respectively the above animals in respectively
ඉහත සතුන් ජීවත් වන පරිසර පිළිවෙලින් ලියන්න.

ii) Write 2 features of fish that they use to adapt themselves for their living environment.
ජීවත් වන පරිසරයට වඩාත් හොඳින් ගැලපීමට මත්ස්‍යයකු සතු ලක්ෂණ 2 ක් ලියන්න. (ල 02)

iii) Write a problem that a squirrel will face if it going to live in water.
ලේනාට ජලජ පරිසරයක ජීවත් වීමට සිදුවුයේ නම් මුහුණ දීමට සිදුවන ගැටළුවක් ලියන්න. (ල 01)

iv) How can you classify animals according to the food they take in ?
ගන්නා ආහාර අනුව සතුන් වර්ග කරන්නෙ කෙසේද ? (ල 03)

v) Write two special adaptations of a tiger's feeding methods.
කොටියකුගේ භෝජන විලාශය සඳහා ඇති විශේෂ හැඩ ගැසීම් දෙකක් ලියන්න. (ල 01)